Nestlé Good food, Good life

මාධ්‍ය නිවේදන

2022 මාර්තු 29, කොළඹ

# නෙස්කැෆේ සහ මැගී, 2022 ස්ලිම්-කැන්ටාර් ජනතා සම්මාන උළෙලේදී ශ්‍රී ලාංකික හදවත් දිනාගනියි

නෙස්ලේ නිෂ්පාදන සඳහා ශ්‍රී ලාංකිකයින්ගේ ජනාදරය පිළිබිඹු කරමින්, 2022 ස්ලිම්-කැන්ටාර් ජනතා සම්මාන උළෙලේදී, වසරේ උණුසුම් පාන සන්නාමය ලෙස නෙස්කැෆේ ද, වසරේ ස්නැක් සන්නාමය ලෙස මැගී ද, සම්මානයෙන් පිදුම් ලැබීය. අඛණ්ඩව 16 වැනි වරටත් ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM) විසින් සංවිධානය කරන ලද මෙවර ජනතා සම්මාන උළෙල පැවැත්වූයේ 'Heart Share' යන තේමාව යටතේ ය. ඒ අනුව, සන්නාම සහ පුද්ගලයින් සමඟ ශ්‍රී ලාංකික පාර්භෝගිකයින් සතු හෘදයාංගම බැඳීමට මෙවර මුල් තැනක් හිමිවිය.

"ආරම්භයේ පටන්ම අපි අපගේ පාරිභෝගිකයින්ගේ අවශ්‍යතාවයන්ට සහ රුචිකත්වයන්ට මුල් තැන දෙමින් කටයුතු කළ සමාගමකි. එම නිසා, අපගේ ප්‍රමුඛතම නිෂ්පාදන සන්නාම දෙකක්වන නෙස්කැෆේ සහ මැගී සඳහා ජනතා සම්මාන හිමිවීම අපට මහත් සේ ප්‍රීතිය දනවන්නකි. වසර 115කට වැඩි කාලයක් පුරාවට, ශ්‍රී ලාංකික පාරිභෝගිකයින් අපගේ නිෂ්පාදන රසවිඳීම අපට නිහතමානී ආඩම්බරයක්. ඒ වගේම, දිනෙන් දින වෙනස්වන පාරිභෝගික අවශ්‍යතා නිවැරදිව හඳුනාගැනීමට සමත් සමාගමක් වීම පිළිබඳවත් අපි ආඩම්බර වෙනවා. ඉදිරියටත් ශ්‍රී ලාංකික පාරිභෝගිකයින් පෝෂණය කිරීමට, ගුණයෙන් සහ රසයෙන් පිරුණු ආහාරපාන තේරීම් පිරිනමමින්, යහපත් ආහාර, යහපත් ජීවිතයක් (Good food, Good life) යන අපගේ පොරොන්දුව සඳහා කැපවී කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා", යනුවෙන් නෙස්ලේ ලංකා කළමනාකාර අධ්‍යක්ෂ ජේසන් ඇවන්සෙනා මහතා ප්‍රකාශ කළේය.

100% පිරිසුදු කෝපි ඇටවල යහගුණය අඩංගු වූ නෙස්කැෆේ, ඊටම ආවේණික සුවිශේෂී සුවඳ සහ උසස් රසය නිසාවෙන් ශ්‍රී ලාංකිකයන්ගේ ඉහළ ජනාදරයට පාත්‍ර වූ පානයක් වන අතර, පාරිභෝගිකයන් දවස පුරා ප්‍රබෝධමත්ව තබයි. මැගී යනු වසර 30කට අධික කාලයක් පුරා ශ්‍රී ලාංකිකයින්ගේ ප්‍රියතම නූඩ්ල්ස් සන්නාමවලින් එකකි. උසස්ම අමුද්‍රව්‍ය යොදාගනිමින් ශ්‍රී ලංකාවේදී නිෂ්පාදනය කරනු ලබන මැගී නූඩ්ල්ස් විවිධ රස කිහිපයකින් වෙළෙඳපොළට හඳුන්වා දී ඇත. මැගී පපරේ ස්පයිසි චිකන් රසැති නූඩ්ල්ස් පෙළ එහි අලුත්ම නිෂ්පාදනය යි.

ස්ලිම්-කැන්ටාර් ජනතා සම්මාන උළෙල යනු ශ්‍රී ලංකාවේ ඉහළම පිළිගැනීමක් ලත් සම්මාන උළෙලකි. ශ්‍රී ලාංකිකයින්ගේ හදවත් දිනාගත් සන්නාම සහ පුද්ගලයින්ට බුහුමන් දැක්වීම එහි අරමුණ වේ. කැන්ටාර් සමාගම විසින් සංවිධානය කරන ලද සම්මුඛ සාකච්ඡා ආශ්‍රය කරගනිමින්, ජනතාාව විසින් මෙම සම්මානලාභීන් තෝරාගැනීම මෙහි ඇති විශේෂත්වය යි.

නෙස්ලේ යනු වසර 115කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකික ජීවිතවලට බද්ධ වූ සමාගමකි. වර්තමාන සහ අනාගත පරපුරට ජීවිතයේ ගුණාත්මකබව වර්ධනය කරගැනීම සඳහා ආහාර සතු ශක්තිය මුදාහැරීමේ අරමුණ සමඟ ක්‍රියා කරන නෙස්ලේ සමාගම, තම ආහාර සහ පාන වර්ග නිෂ්පාදන පෙළ හරහා මුල් ළමාවියේ සිට වැඩිහිටි විය දක්වා පුළුල් පරාසයක පාරිභෝගිකයින්ට සමීප වී ඇත.

---

**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |